C
378
WAN

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා ගුරු පුහුණු පාඨමාලා ප්‍රතිසංවිධානය : පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගුරු ශිෂ්‍ය නියැදියක් ආශ්‍රයෙන් කරන අධ්‍යයනයක්

## A STUDY OF THE WAYS IN WHICH THE POST-GRADUATE DIPLOMA IN EDUCATION COURSES COULD BE REORGANIZED: A STUDY CONDUCTED IN ASSOCIATION WITH UNIVERSITY OF PERADENIYA BASED ON A SAMPLE OF STUDENT TEACHERS

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන අංශයේ
අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධනය
2000

POSTGRADUATE UNIT
FACULTY OF ARTS
05 SEP 2001
UNIVERSITY OF PERADENIYA
PERADENIYA

ඩබ්. එම්. ශාමින්ද වනසිංහ
ශාස්ත්‍රවේදී උපාධිය,
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට)
ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා (විශිෂ්ට)

*පර්යේෂණ උපදේශිකා*
*පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන විද්‍යා අංශයේ*
*ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී, ආචාර්ය සිල්වි සේනාධීර මහත්මිය*

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

546370

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

# සංක්ෂිප්තය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව ප්‍රතිසංවිධානය විය යුතු ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලිකම පරමාර්ථය විය. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ වර්තමාන තත්ත්වය හඳුනා ගැනිම, පාඨමාලාව සඳහා නව ආකෘතියක් සැකසීමේදී යෝග්‍ය දාර්ශනික සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක පදනම හඳුනා ගැනිම, පාඨමාලාවට ඇතුළත් කළ යුතු නව විෂයයන්, ඉගැන්වීම් ක්‍රම හඳුනා ගැනිම හා අඛණ්ඩ ඇගයීම මගින් ඇගයීමේ අවශ්‍යතා හඳුනා ගැනිම යන ප්‍රධාන අරමුණු පහක් ඔස්සේ අධ්‍යයනය මෙහෙයවනු ලැබීය.

උක්ත අරමුණු ඉටු කර ගැනිම සඳහා විවිධ විෂයමාලා ආකෘති ඉදිරිපත් කිරීමේදී අධ්‍යාපනඥයන් අනුගමනය කළ පදනම න්‍යායාත්මක පදනම ලෙස සලකා කටයුතු කෙරිණි. ඒ අනුව සමීක්ෂණ ක්‍රමවේදය යටතේ ලේඛනගත සමීක්ෂණය හා නියැදි සමීක්ෂණය දත්ත රැස් කිරීමේදී අනුගමනය කරන ලදි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උක්ත පාඨමාලාව හදාරණු ලබන 1997/1998 අධ්‍යයන වර්ෂයේ ගුරු ශිෂ්‍යයන්ගෙන් 200ක අහඹු නියැදියක් ද, පාඨමාලාව ක්‍රියාත්මක කරන ආයතන අතුරින් තෝරා ගත් 36 ක කථිකාචාර්ය නියැදියක් ද, අධ්‍යාපනඥයන් 10ක් වූ සාරම්මන නියැදියක් ද දත්ත රැස් කිරීම සඳහා භාවිත කරනු ලැබීය.

අධ්‍යයනයේදී ලබා ගත් දත්ත ප්‍රතිශතක ඇසුරින් ගුණාත්මක විශ්ලේෂණයක යෙදුනු අතර ඒ තුළින් ප්‍රධාන නිගමන 11කට එළඹීමට හැකි විය. ඒවා නම් වෘත්තිය සංවර්ධනය මූලික අරමුණු විය යුතු බව, වර්තමාන අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව ප්‍රතිසංවිධානය අවශ්‍ය වීම, අනිවාර්ය විෂයයන් අනාගතයේත් ක්‍රියාත්මක විය යුතුබව, අධ්‍යාපන තාක්ෂණය හා අධ්‍යාපන සමාජ විද්‍යාව අනිවාර්ය විය යුතු බව, නව විෂයයන් හඳුන්වා දිමේ අවශ්‍යතාව, ඇගයීම්

විවිධාංගීකරණය විය යුතු බව, ගුණාත්මක ඉගැන්වීම් පුහුණුවක් ලබා දීම, අර්ධ පර්යේෂණ කෘතියේ ගුණාත්මක බව වර්ධනය කිරීම, ඉගැන්වීම් ක්‍රම විෂයය ප්‍රායෝගික වීම හා විෂය සමගාමී පුහුණුවක අවශ්‍යතාව යන නිගමනයි.

උක්ත නිගමන පදනම් කර ගෙන යෝජනා ඉදිරිපත් කිරීම පර්යේෂණයේ අවසාන අදියර විය. පාඨමාලාව ප්‍රතිසංවිධානය සඳහා ආකෘතියක් ඉදිරිපත් කිරීම මූලිකම යෝජනාව විය. ඊට අමතරව තේමා ආශ්‍රිතව ඉගැන්වීම, අනුගමනය කළ හැකි ඉගැන්වීම් ක්‍රම හඳුන්වා දීම, නිපුණතා පාදක ඇගයීම හඳුන්වා දීම හා අර්ධ පර්යේෂණ කෘතියේ ගුණාත්මක බව දියුණු කිරීම, ඉගැන්වීම් පුහුණුව අධීක්ෂණය කිරීම හා විෂය සමගාමී පුහුණුව ලබා දිය හැකි ආකාරය, ශික්ෂණ පාසලක් ඇති කිරීම ආදි අංශ පිළිබඳව යෝජනා ඉදිරිපත් කරන ලදි.

ඉහත කරුණු පදනම් කරගෙන ප්‍රධාන පරිච්ඡේද හතක් ඔස්සේ පර්යේෂණ වාර්තාව පිළියෙල කරනු ලැබූ අතර පර්යේෂණය තුළින් අනාගත ප්‍රතිසංවිධාන ක්‍රියාවලියකදී යම් ආලෝකයක් ලබා ගත හැකි වෙතැයි පර්යේෂකයාගේ අදහසයි.

# ABSTRACT

This research study has been directed with the purpose of exploring the nature of the Post Graduate Diploma in Education Course conducted by the University of Peradeniya. The study investigates the nature of the curriculum including teaching practice and part dissertation, teaching methods and how its evaluation procedures should be improved.

The literature survey of relevant materials revealed an array of information relating to the subject under investigation and their influence was fruitfully used in making the relevant proposals in this study.

This study conducted following the descriptive research methodology utilized the questionnaires and interviews as instruments of collecting data. Two hundred teacher trainees in the academic year 1997/1998, twenty lectures and ten educationists comprised the selected sample.

Data thus collected were analyzed and results have been presented. Some of the main conclusions arrived at are,

1. The main purpose of the course of studies should be focused on the professional development of teacher trainees.
2. The course of studies should be constantly improved and modified in conformity with the curriculum innovations introduced in schools.
3. In addition to teaching the teacher trainees should be exposed to practical orientation relating to teaching methodology.

4. The re-organization of the evaluation system used in teaching practice.

5. Modification of the presentation of the part dissertation, are some of the conclusions arrived by this study.

The main proposal of this study has been the presentation of a curriculum model for the Post Graduate Diploma Course. In making this proposal an attempt was made to introduce practical computer skills, educational research methods, competency in English, Educational Law, re-organization of subjects by themes, competencies relating to continuous assessment, competency based assessment, self assessment, encouraging the teacher trainees to present a self improved product by the part dissertation establishing a model practicing school, are some of the innovations introduced in the proposed curriculum model.

The model included several other recommendations for building up a new generation of teachers endowed with qualitative abilities.